# ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම තක්සේරු කිරීමේ සමීක්ෂණය - 2023

# අනාවරණ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්,ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# හැඳින්වීම

- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන (MSMEs) පිළිබඳ මෙම සමීක්ෂණය රට මුහුණ දී ඇති අර්බුදවල බලපෑම මැන බැලීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසින් කරන ලද ආයතනික සමීක්ෂණයකි.

- ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන අංශයේ නියැලී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ආර්ථික අර්බුදයේ බලපෑම වෙත ප්‍රවේශ වීම සඳහා කරන ලද සමීක්ෂණයේ සොයාගැනීම් මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

- 2018 වසරේ ක්‍රියාත්මක වූ MSME වලින් 79.8% ක් 2022 වසර අවසානයේ ක්‍රියාත්මකව පවතින බව සමීක්ෂණ සොයාගැනීම්වලින් හෙළි වී ඇත. 20.2% ව්‍යාපාර ස්ථිරව හෝ තාවකාලිකව වසා දමා ඇති අතර, 8.3% ක් වසා දැමීම් ආර්ථික අර්බුද හේතුවෙන් වාර්තා වී ඇති අතර 11.9 % ආර්ථික අර්බුදයක් හැර වෙනත් හේතු නිසා විය. ස්ථිරව වසා දැමූ ව්‍යාපාර සංඛ්‍යාව තාවකාලිකව වසා දැමූ ව්‍යාපාරවලට වඩා තුන් ගුණයකටත් වඩා වැඩිය. 33.4% සමග 2020 සඳහා වැඩිම වසා දැමීම් ප්‍රතිශතය වාර්තා විය. 2019-2022 කාලය තුළ වසා දැමූ මුළු ව්‍යාපාර අතරින් 41.1%ක් තම ව්‍යාපාර වසා දැමීමට හේතුවක් ලෙස ආර්ථික අර්බුදයක් වාර්තා කර ඇති අතර එයින් පෙන්නුම් කරන්නේ වසා දැමීම්වලින් 58.9%ක් ආර්ථික අර්බුදයක් නිසා නොවන බවයි.

- තවද, වසා දැමූ ව්‍යාපාරවලින් 45.3%ක් කොවිඩ් වසංගතය වසා දැමීමට හේතුවක් ලෙස වාර්තා කර ඇති අතර එයින් ඇඟවෙන්නේ වසා දැමීම්වලින් 54.7%ක් කොවිඩ් වසංගතය නිසා සිදුවී නොමැති බවයි.

- සංවෘත ව්‍යාපාරවල ආංශික සංසන්දනයකදී හෙළි වන්නේ දැනට ක්‍රියාකාරීව පවතින ව්‍යාපාර 78.8%ක් පමණක් වන අතර ක්ෂුද්‍ර අංශයට වඩාත්ම බලපෑම එල්ල වී ඇති බවයි. 91.7% ක්‍රියාකාරී ව්‍යාපාර සමඟින් කුඩා පරිමාණ ව්‍යාපාරවලට අවම බලපෑමක් එල්ල විය. තවද, කර්මාන්ත, වෙළඳ සහ සේවා යන කාණ්ඩ තුනේම නියැලී සිටින ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාරවලට සමානව බලපෑනු ලබයි. කුඩා පරිමාණ ව්‍යාපාරවලදී, කර්මාන්ත අංශයේ ඒකක වැඩිපුරම බලපාන අතර මධ්‍යම පරිමාණයෙන් එය සේවා අංශය වේ.

- 2018 සිට වසර ගණනාවක් පුරා කුඩා හා මධ්‍ය පරිමාණයේ රැකියා නියුක්තිය උච්චාවචනය වී ඇත. 2020 සහ 2021 හි පහත වැටීම ඉහළ මට්ටමක පැවති අතර 2022 දී සුළු වැඩිවීමක් සටහන් විය.

# ක්‍රමවේදය

- ආවරණය : 2018 වසරේ සක්‍රීයව පැවති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු සිදුකරනු ලබන ව්‍යාපාර
- යොමු කාලය: 2018 – 2022
- නියදුම් ක්‍රමවේදය: ස්තෘත සසම්භාවී නියැදීම
- ස්ථර: ආර්ථික කටයුත්ත, ව්‍යාපාරයේ පරිමාණය
- නියැදි තරම: ව්‍යාපාර ආයතන 7,813
- නියැදිය සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් අංශයේ දායකත්වය
  ක්ෂුද්‍ර : 1630
  සුළු : 901
  මධ්‍ය : 482
- <u>දත්ත එක් රැස්කිරීම</u>
  - දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ මගින්, සන්නිවේදන තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් සමස්ත දිවයිනේම සමීක්ෂණ ක්‍රියාවලිය නියාමනය කරන ලදී.
  - විද්‍යුත් තැපැල හා dashboards භාවිතා කර දත්ත සංස්කරණය කිරීම.

# ක්‍රමවේදය

**භාවිතා කරන ලද අර්ථදැක්වීම:**

2013/14 ආර්ථික සංගණනයේ දී ව්‍යාපාරික ආයතන වල **සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාව** අනුසාරයෙන් සකසන ලද අර්ථ දැක්වීම.

| අංශ | ක්ෂුද්‍ර | කුඩා | මධ්‍ය |
|---|---|---|---|
| කර්මාන්ත හා ඉදිකිරීම් | 5 ට අඩු | 5-24 | 25-199 |
| වෙළඳ | 4 ට අඩු | 4-14 | 15-34 |
| සේවා | 5 ට අඩු | 5-15 | 16-74 |

# 2018 න් පසු

# වසා දමන ලද

# ව්‍යාපාර

# ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල තත්ත්වය 2018 - 2022

| වත්මන් තත්ත්වය | ව්‍යාපාර සංඛ්‍යාව (000’) | % |
|---|---|---|
| සක්‍රීය | 1,037.1 | 79.8 |
| තාවකාලිකව වසාදමන ලද | 59.1 | 4.5 |
| ස්ථිරව වසාදමන ලද | 204.1 | 15.7 |
| එකතුව | **1,300.3** | **100.0** |




මෙහි වෙළෙඳ, සේවා, කර්මාන්ත හා ඉදි කිරීම් යන සියලුම අංශ ඇතුළත් වන අතර 2018 සිට 2022 දක්වා වසර 5 තුළ එම ව්‍යාපාර වල වැසී යාම නිරූපණය වේ.

# ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල තත්ත්වය 2018 - 2022

## කර්මාන්ත හා ඉදිකිරීම් අංශය

| වත්මන් තත්ත්වය | % |
|---|---|
| සක්‍රීය | 79.6 |
| තාවකාලිකව වසාදමන ලද | 7.8 |
| ස්ථිරව වසාදමන ලද | 12.6 |
| **ඒකතුව** | **100.0** |

මෙහි කර්මාන්ත හා ඉදි කිරීම් යන අංශ පමණක් ඇතුළත් වන අතර 2018 සිට 2022 දක්වා වසර 5 තුළ එම ව්‍යාපාර වල වැසී යාම නිරූපණය වේ.

# වසා දැමූ වර්ෂය අනුව ස්ථිරව හෝ තාවකාලිකව වසා දැමූ ව්‍යාපාර

- 2019 සිට 2022 දක්වා වසා දැමුණු සමස්ත ව්‍යාපාර සංඛ්‍යාවට සාපේක්ෂව එක් එක් වසර සඳහා ප්‍රතිශතයන් ගණනය කර ඇත.
- 2019-2022 අතර වැඩිම වසා දැමීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ 2020 සඳහා ය.
- අඩුම වසා දැමීම් සංඛ්‍යාව 2019 සඳහා වාර්තා විය.

| වසා දැමූ වසර | % |
|---|---|
| 2019 | 9.9 |
| 2020 | 33.4 |
| 2021 | 27.4 |
| 2022 | 29.3 |
| **2019 to 2022** | **100.0** |

*සටහන: වසා දමා ඇති ඇතැම් ව්‍යාපාරවල **වැසූ වසර දැනගැනීමට නොහැකි වූ අවස්ථා තිබුණි.** එබැවින් එම වසරවල වාර්තා වූ මුළු ව්‍යාපාර සංඛ්‍යාට සාපේක්ෂව වගුවේ ප්‍රතිශත ගණනය කරන ලදී.*

# ව්‍යාපාර වල තත්ත්වය - වෙළෙඳ, සේවා, කර්මාන්ත හා ඉදි කිරීම වසා දැමීමට වාර්තා වූ හේතුව අනුව




ව්‍යාපාර වලින් 8.3%ක් තම ව්‍යාපාරය ආර්ථික අර්බුදය නිසා වසා දැමුණු බව වාර්තා කර ඇත.

# ව්‍යාපාර වල තත්ත්වය - කර්මාන්ත හා ඉදිකිරීම් අංශය

## වසා දැමීමට වාර්තා වූ හේතුව අනුව




ව්‍යාපාර වලින් 9.2%ක් තම ව්‍යාපාරය ආර්ථික අර්බුදය නිසා වසා දැමුණු බව වාර්තා කර ඇත

# 2022 දී

# ව්‍යාපාරවල

# පැවති තත්ත්වය



# ව්‍යාපාරයේ පරිමාණය සහ ප්‍රධාන ආර්ථික අංශය අනුව 2022 දී පැවති තත්ත්වය

- ආර්ථික අර්බුදය හේතුවෙන් වැසී ගිය ව්‍යාපාරවලින් වැඩිම ප්‍රතිශතයක් වෙළෙඳ හා සේවා අංශයට සාපේක්ෂව **කර්මාන්ත අංශයෙන් වාර්තා විය.**

- සක්‍රිය ව්‍යාපාරවලින් අඩුම ප්‍රතිශතය (77.2%) සහ වසා දැමුණු ව්‍යාපාරවල ඉහළම ප්‍රතිශතය (22.8%) මධ්‍ය පරිමාණ අංශයේ සේවා ක්‍රියාකාරකම්වලින් වාර්තා විය.

| ප්‍රධාන ආර්ථික අංශය | ක්ෂුද්‍ර | | | කුඩා | | | මධ්‍ය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සක්‍රිය % | % වසා ඇත: ආර්ථික අර්බුදය | % වසා ඇත: කෝවිඩ් හෝ වෙනත් | සක්‍රිය % | % වසා ඇත: ආර්ථික අර්බුදය | % වසා ඇත: කෝවිඩ් හෝ වෙනත් | සක්‍රිය % | % වසා ඇත: ආර්ථික අර්බුදය | % වසා ඇත: කෝවිඩ් හෝ වෙනත් |
| කර්මාන්ත | 78.5 | 9.8 | 11.7 | 87.1 | 5.6 | 7.3 | 92.7 | 1.5 | 5.7 |
| වෙළෙඳ | 79.8 | 9.1 | 11.0 | 96.6 | 0.9 | 2.5 | 97.1 | 1.1 | 1.7 |
| සේවා | 78.4 | 8.2 | 13.4 | 90.0 | 2.3 | 7.7 | 77.2 | 1.2 | 21.6 |
| එකතුව | **78.8** | **8.8** | **12.4** | **91.7** | **2.7** | **5.6** | **86.8** | **1.3** | **11.9** |

# ප්‍රධාන ආර්ථික අංශය සහ ව්‍යාපාර පරිමාණය මගින් ආර්ථික අර්බුදය හේතුවෙන් වසා දැමූ ව්‍යාපාර වල ව්‍යාප්තිය

- ආර්ථික අංශ තුනේම ආර්ථික අර්බුදය හේතුවෙන් ක්ෂුද්‍ර ව්‍යවසායන්ගෙන් 8%කට වැඩි ප්‍රමාණයක් වැසී ගොස් ඇති අතර, මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා එය 2%කට වඩා අඩුය.

- ආර්ථික අර්බුදය හේතුවෙන් වැසී ගිය අඩුම ප්‍රතිශතය කුඩා අංශයේ වෙළෙඳ ව්‍යාපාරවලින් වාර්තා වී ඇති අතර, එම ප්‍රතිශතය 2%ට වඩා අඩුය.



# කර්මාන්ත අංශයේ හා ඉදිකිරීම් අංශය
# 2022 තත්වය

| ආර්ථික කටයුත්ත | සක්‍රීය | ආර්ථික අර්බුදය හේතුවෙන් වසා දැමීම් | වෙනත් හේතුවක් නිසා වසා දැමීම් |
|---|---|---|---|
| පතල් හා කැණීම | 55.8 | 24.6 | 19.6 |
| ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය | 77.5 | 11.9 | 10.6 |
| බීම වර්ග නිෂ්පාදනය | 85.7 | 4.6 | 9.7 |
| රෙදි නිෂ්පාදනය | 74.7 | 4.1 | 21.2 |
| ඇඟලුම් නිෂ්පාදනය | 86.5 | 5.9 | 7.6 |
| හම් හා හම් ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය | 76.5 | 1.8 | 21.7 |
| ගෘහ භාණ්ඩ හැර දැව, දැව නිෂ්පාදන හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරු වලින් කරන ලද ද්‍රව්‍යය හා ගොතන ලද ද්‍රව්‍යය | 88.0 | 6.0 | 6.1 |
| කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය | 75.7 | 0.4 | 23.9 |
| මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය | 80.5 | 6.5 | 12.9 |
| රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය | 82.9 | 12.2 | 4.9 |

| ආර්ථික කටයුත්ත | සක්‍රීය | ආර්ථික අර්බුදය හේතුවෙන් වසා දැමීම් | වෙනත් හේතුවක් නිසා වසා දැමීම් |
|---|---|---|---|
| වෙනත් ලෝහමය නොවන ඛණිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය | 68.3 | 15.2 | 16.5 |
| පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර) | 79.2 | 10.2 | 10.6 |
| ගෘහ භාණ්ඩ නිපද වීම | 89.7 | 2.2 | 8.1 |
| අනෙකුත් නිෂ්පාදන | 86.0 | 8.5 | 5.5 |
| අළුත්වැඩියා කිරීම හා යන්ත්‍ර උපකරණ හා අනෙකුත් උපකරණ සවි කිරීම | 95.2 | 1.3 | 3.5 |
| ජලය එක්රැස් කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම | 89.8 | 2.7 | 7.5 |
| ඉදිකිරීම | 71.3 | 13.0 | 15.7 |

ඉහත දක්වා ඇත්තේ 20% කට වඩා එනම් 1/5 කට අධික ප්‍රමාණයක් 2018-2022 කාලය තුළ වැසී ගිය ක්ෂේත්‍ර වේ. එය සැලකිය යුතු ප්‍රමාණාත්මක විශ්ලේෂණය කි.

ඉහත කර්මාන්ත වර්ගීකරණය ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණයට (revision iv) අනුව වර්ගීකරණය ඇත. නියැදිය තුළ ඇතුළත් වූ ව්‍යාපාර තුළින් කර්මාන්ත හා ඉදිකිරීම් අංශයට අදාළ සියලුම ව්‍යාපාර ඉහත සඳහන් උප අංශවලට ඇතුළත් වේ.

# සේවා

# නියුක්තිකයන්ගේ

# වෙනස්වීම



DCS

| දර්ශකය | පරිමාණය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාව (000') | ක්ෂුද්‍ර | 1637.8 | 1635.2 | 1.686.7 | 1644.7 | 1673.3 |
| | කුඩා | 673.3 | 630.5 | 414.6 | 456.2 | 586.3 |
| | මධ්‍ය | 485.5 | 414.4 | 262.4 | 266.1 | 291.6 |
| | එකතුව | 2796.6 | 2680.1 | 2363.7 | 2367.0 | 2551.2 |
| 2018 ට සාපේක්ෂව සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාවේ වෙනස (%) | ක්ෂුද්‍ර | 100.0 | 99.8 | 103.0 | 100.4 | 102.2 |
| | කුඩා | 100.0 | 93.6 | 61.6 | 67.8 | 87.1 |
| | මධ්‍ය | 100.0 | 85.4 | 54.0 | 54.8 | 60.1 |
| | එකතුව | 100.0 | 95.8 | 84.5 | 84.6 | 91.2 |

## 2018 - 2022 කාලය තුළ ව්‍යාපාර පරිමාණය අනුව සේවයේ නියුතු සිටින පුද්ගලයින් සංඛ්‍යාව සහ % වෙනස

- 2021 දී 0.1% ක සුළු වැඩිවීමක් සමඟ 2018 සිට 2020 දක්වා මුළු සේවක සංඛ්‍යාවේ අඛණ්ඩ අඩුවීමක් දක්නට ලැබේ. නමුත් එය 2018 මට්ටමට පැමිණ නැත.
- කුඩා හා මධ්‍ය පරිමාණ අංශවල සේවක සංඛ්‍යාව 2020 දක්වා අඩු වී 2021 සිට ඉහළ යාමක් පෙන්නුම් කරයි.
- ක්ෂුද්‍ර අංශය වසර පුරාවටම රැකියා කටයුතුවල සුළු උච්චාවචනයන් පමණක් අත්විඳින අංශයක් වී ඇත.

| අංශය | සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාව (000') | | | | |
|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| කර්මාන්ත | 899.9 | 854.1 | 710.4 | 705.6 | 725.7 |
| වෙළඳ | 776.1 | 764.7 | 700.3 | 704.9 | 746.1 |
| සේවා | 1,120.5 | 1,061.3 | 953.0 | 956.4 | 1,079.4 |
| එකතුව | **2,796.6** | **2,680.1** | **2,363.7** | **2,367.0** | **2,551.2** |

## ප්‍රධාන ආර්ථික අංශ අනුව සේවා නියුක්තිය වෙනස් වීම 2018 – 2022

- **2022 දී සුළු වැඩිවීමක් සමඟ 2018 සිට 2021 දක්වා කර්මාන්ත අංශයේ සමස්ත සේවක සංඛ්‍යාවේ අඛණ්ඩ අඩුවීමක් දක්නට ලැබේ.**
- වෙළඳ හා සේවා අංශයේ සේවක සංඛ්‍යාව 2020 දක්වා අඩු වූ අතර 2021 සිට වැඩි වීමක් දක්නට ලැබුණි.

# අභියෝග

# සඳහා

# මුහුණ දීම



# ණය ලබාගත් මූලාශ්‍ර ව්‍යාපාර පරිමාණය අනුව – 2022 (%)

| මූලාශ්‍රය | පරිමාණය | | |
|---|---|---|---|
| | ක්ෂුද්‍ර | කුඩා | මධ්‍ය |
| බැංකුව | 67.4 | 79.2 | 91.0 |
| වෙනත් මූල්‍ය ආයතන | 39.8 | 29.9 | 25.9 |
| පොළියට මුදල් ලබා දෙන්නන් | 13.4 | 14.8 | 8.7 |
| වෙනත් | 2.8 | 1.7 | 1.3 |

වෙනත් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම ව්‍යාපාර පරිමාණය අනුව



DCS

## ණය ගෙවීමේ දුෂ්කරතා අවම කරගැනීම සඳහා අනුගමනය කරන ලද උපායමාර්ග 2022 (%)

| උපායමාර්ග | කර්මාන්ත | වෙළෙඳ | සේවා |
|---|---|---|---|
| මූල්‍ය ආයතන මඟින් ණය ප්‍රතිව්‍යුහගත කිරීම | 15.4 | 18.6 | 20.2 |
| ව්‍යාපාරයේ වියදම් සීමා කිරීම මඟින් ණය ගෙවීමේ හැකියාව වැඩි කිරීම | 15.1 | 15.4 | 9.7 |
| අලුත් ණයක් හෝ වෙනත් මූල්‍ය පහසුකමක් ලබා ගැනීම | 15.5 | 18.0 | 13.1 |
| ව්‍යාපාරයේ වත්කම් විකිණීම/ව්‍යාපාරයේ ඉතුරුම්,ස්ථාවර තැන්පතු යොදා ගැනීම | 10.9 | 12.3 | 8.0 |
| පෞද්ගලික වත්කම් විකිණීම/ස්ථාවර තැන්පතු ආපසු ගැනීම/උකස් කිරීම | 17.0 | 18.1 | 15.3 |
| **කිසිදු පියවරක් ගෙන නොමැත** | **3.7** | **2.3** | **4.6** |

# ණය ගෙවීමේ දුෂකරතා අවම කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැති වීම - 2022 (%)

- ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාරවලින් 100කින් 9ක්ම ණය පියවීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් අනුගමනය කර නැත.
- එම ප්‍රතිශතය(9.2%) අනෙකුත් පරිමාණ ව්‍යාපාරවලට වඩා කැපී පෙනෙන ලෙස ඉහළ ය.
- ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා නිසි ක්‍රමවේදයක් අවශ්‍ය බව මින් තහවුරු වේ.



DCS

# මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතා මඟහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ගn - 2022 (%)

- පරිමාණ තුනේම ව්‍යාපාරිකයන් ඔවුන්ගේ වියදම් සීමා කිරීම ඉහළ ප්‍රතිශතයක පවතී.

- මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සාපේක්ෂව ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායන් මුදල් ණයට දෙන්නන්ගෙන් සේවා ලබා ගැනීම ඉහළය.

| උපායමාර්ගයන් | පරිමාණය | | |
|---|---|---|---|
| | ක්ෂුද්‍ර | කුඩා | මධ්‍ය |
| ව්‍යාපාරයේ වියදම් සීමා කිරීම | 46.0 | 62.4 | 66.1 |
| ව්‍යාපාරයේ ඉතුරුම්/ස්ථාවර තැන්පතු භාවිතා කිරීම | 27.1 | 40.9 | 36.9 |
| පෞද්ගලික වත්කම් විකිණීම/ස්ථාවර තැන්පතු අපසු ගැනීම/පෞද්ගලික වත්කම් භාවිතයෙන් කළමනාකරනය | 33.6 | 38.9 | 34.5 |
| මුදල් ණයට දෙන්නන්ගේ සේවය ලබා ගැනීම | 29.1 | 29.2 | 19.0 |
| තෝරාගත් භාණ්ඩ/සේවා ආනයනය/වෙළදාම නැවැත්වීම ,අඩු කිරීම මඟින් සීමා කිරීම් | 15.2 | 21.4 | 16.9 |
| ව්‍යාපාරයේ වත්කම් විකිණීම | 10.9 | 17.0 | 13.9 |
| **කිසිදු පියවරක් ගෙන නොමැත** | **15.3** | **5.1** | **11.6** |

# මූලාා පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතා මඟහරවා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම - 2022 (%)

- ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යවසායන් 100 න් 15 ක් මූල්‍ය දුෂ්කරතා අවම කර ගැනීමට කිසිවක් කර නැත.
- මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ද එයට මුහුණ දීමට ප්‍රමාණවත් හැකියාවක් තිබුණද එම ප්‍රමාණයද සැලකිය යුතු ලෙස ඉහළ ය.
- ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායන් අතර මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා නිසි ක්‍රමවේදයක් අවශ්‍ය බව තහවුරු වේ.



# බලපෑම කළමනාකරණය කිරීමට ගෙන ඇති පියවර - 2022

| ක්‍රියාමාර්ග | කර්මාන්ත | | | වෙළඳ | | | සේවා | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශාල | මධ්‍ය | කුඩා | විශාල | මධ්‍ය | කුඩා | විශාල | මධ්‍ය | කුඩා |
| 1. නිෂ්පාදන මිල වැඩි කිරීම | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 35% - 49% | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 20% - 34% |
| 2. අමුද්‍රව්‍ය සඳහා සුදුසු විකල්ප ආදේශණය කිරීම | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% |
| 3. නිෂ්පාදන ප්‍රමාණය / නිශ්චිත නිෂ්පාදන / ආනයන / වැඩකරන දින ගණන අඩුකිරීම හෝ සීමා කිරීම | 35% - 49% | 35% - 49% | 35% - 49% | 20% - 34% | 20% - 34% | 20% - 34% | 5% - 19% | 5% - 19% | 5% - 19% |
| 4. වැදගත්කමින් අඩු වියදම් කපාහැරීම හා අවම කිරීම | 35% - 49% | 35% - 49% | 50% හෝ වැඩි | 35% - 49% | 50% හෝ වැඩි | 50% හෝ වැඩි | 20% - 34% | 35% - 49% | 20% - 34% |
| 5. ආර්ථික කටයුත්ත හෝ ක්‍රියාකාරකම වෙනස් කිරීම | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% ට අඩු | 5% ට අඩු | 5% - 19% | 5% ට අඩු |
| 6. සේවක සංඛ්‍යාව අඩු කිරීම | 5% - 19% | 35% - 49% | 35% - 49% | 5% - 19% | 20% - 34% | 35% - 49% | 5% - 19% | 20% - 34% | 20% - 34% |
| 7. සේවකයින් සඳහා දුරස්ථ වැඩකිරීමේ ක්‍රම හඳුන්වාදීම | 5% ට අඩු | 5% - 19% | 20% - 34% | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% - 19% | 5% - 19% |
| 8. සේවක ප්‍රතිලාභ/වැටුප්/දීමනා අඩුකිරීම | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 20% - 34% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% |
| 9. ව්‍යාපාර ක්‍රියාකාරකම් බාහිරින් ලබාගැනීම | 5% ට අඩු | 5% - 19% | 5% - 19% | 5% ට අඩු | 5% - 19% | 5% - 19% | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු |
| 10. නිෂ්පාදන ක්‍රියාවලිය, ගුණාත්මකභාවය, ඇසුරුම්, අලෙවිකරණ උපාය මාර්ග වෙනස්කිරීම | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% ට අඩු | 5% - 19% | 5% ට අඩු |
| 11. අළුතෙන් ණයක් හෝ වෙනත් මූල්‍ය පහසුකමක් ලබාගැනීම | 20% - 34% | 20% - 34% | 35% - 49% | 20% - 34% | 20% - 34% | 35% - 49% | 20% - 34% | 5% - 19% | 20% - 34% |
| 12. ව්‍යාපාරයේ වත්කම් විකිණීම / ව්‍යාපාරයේ ඉතුරුම් / ස්ථාවර තැන්පතු භාවිතා කිරීම | 5% - 19% | 20% - 34% | 20% - 34% | 5% - 19% | 20% - 34% | 20% - 34% | 5% - 19% | 5% - 19% | 5% - 19% |
| 13. පුද්ගලික මට්ටමෙන් හෝ වෙනත් ආධාරක ආකාරයෙන් මූල්‍ය පහසුකම් ලබාගැනීම | 5% - 19% | 20% - 34% | 20% - 34% | 20% - 34% | 20% - 34% | 20% - 34% | 5% - 19% | 20% - 34% | 20% - 34% |
| 14. විදේශ විනිමය ලබාගැනීම සඳහා අවිධිමත් ක්‍රමවේද වලට යොමුවීම | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% - 19% | 5% ට අඩු |
| 15. දේශීය වෙළඳපොළ හෝ විශේෂිත වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කිරීම | 5% ට අඩු | 5% - 19% | 5% - 19% | 5% - 19% | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු | 5% ට අඩු |
| 16. ප්‍රවාහනය සඳහා වෙනත් විකල්ප ක්‍රම භාවිතා කිරීම | 5% - 19% | 5% - 19% | 20% - 34% | 5% - 19% | 5% - 19% | 20% - 34% | 5% - 19% | 5% - 19% | 5% - 19% |
| 17. ජනක යන්ත්‍ර හෝ වෙනත් සූර්යබල විදුලි පද්ධති ස්ථාපිත කිරීම | 5% ට අඩු | 5% - 19% | 20% - 34% | 5% - 19% | 20% - 34% | 35% - 49% | 5% ට අඩු | 5% - 19% | 20% - 34% |
| 18. වැඩකරන දිනගණන හෝ වැඩමුර වෙනස් කිරීම | 20% - 34% | 35% - 49% | 50% හෝ වැඩි | 5% - 19% | 20% - 34% | 20% - 34% | 5% - 19% | 20% - 34% | 5% - 19% |
| 19. කිසිදු පියවරක් ගෙන නොමැත | 5% - 19% | 5% ට අඩු | 5% ට අඩු | 5% - 19% | 5% ට අඩු | 5% ට අඩු | 5% - 19% | 5% - 19% | 5% - 19% |

**වර්ණ කේත**

50% හෝ වැඩි | 35% - 49% | 20% - 34% | 5% - 19%. | 5% ට අඩු

# අනාගත සැලසුම් (%)

| සැලසුම | පරිමාණය | | |
|---|---|---|---|
| | ක්ෂුද්‍ර | කුඩා | මධ්‍ය |
| වත්මන් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාම | 75.4 | 77.3 | 73.3 |
| වත්මන් ව්‍යාපාරය පුළුල් කිරීම | 11.4 | 12.8 | 20.7 |
| වත්මන් ව්‍යාපාරය කරගෙන යන අතරතුර වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කිරීම | 6.4 | 4.7 | 3.2 |
| වත්මන් ව්‍යාපාරය වෙනත් ආර්ථික කටයුත්තකට වෙනස් කිරීම | 1.6 | 0.7 | 0.2 |
| ව්‍යාපාරික ක්‍රියාකාරකම් හැකිලීම(නිෂ්පාදන අඩු කිරීම/සීමා කිරීම/සේවකයන් ඉවත් කිරීම | 1.0 | 1.8 | 1.7 |
| ව්‍යාපාරය විකිණීම හෝ බද්දට දීම | 1.3 | 1.3 | 0.3 |
| ව්‍යාපාරය වසා දැමීම | 2.9 | 1.3 | 0.6 |
| **එකතුව** | **100.0** | **100.0** | **100.0** |

# අනාගත සැලසුම් (%)

| සැලසුම | කර්මාන්ත | වෙළෙඳ | සේවා |
|---|---|---|---|
| වත්මන් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාම | 73.6 | 73.5 | 77.5 |
| වත්මන් ව්‍යාපාරය පුළුල් කිරීම | 16.4 | 14.9 | 7.8 |
| වත්මන් ව්‍යාපාරය කරගෙන යන අතරතුර වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කිරීම | 4.8 | 4.0 | 8.1 |
| වත්මන් ව්‍යාපාරය වෙනත් ආර්ථික කටයුත්තකට වෙනස් කිරීම | 0.7 | 2.0 | 1.5 |
| ව්‍යාපාරික ක්‍රියාකාරකම් හැකිලීම(නිෂ්පාදන අඩු කිරීම/සීමා කිරීම/සේවකයන් ඉවත් කිරීම | 1.6 | 1.7 | 0.5 |
| ව්‍යාපාරය විකිණීම හෝ බද්දට දීම | 0.7 | 0.9 | 1.7 |
| ව්‍යාපාරය වසා දැමීම | 2.2 | 2.9 | 2.9 |
| **එකතුව** | **100.0** | **100.0** | **100.0** |

# මූලාශ්‍ර...

- http://www.statistics.gov.lk/Industry/StaticalInformation/OtherTablesReports/MSMEs_Report

# විශේෂ ස්තූතිය..!

- ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
- කර්මාන්ත අමාත්‍යාංශය